“කවරෙකු දුප්පත් ණයකරුහට කල් දෙන්නේ ද, එසේ නැතහොත් ඔහු වෙනුවෙන් ඔහුගේ (ණයබර) සැහැල්ලු කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත් හෙවණක් නොමැති දිනයේ, ඔහුගේ රාජ්යයේ හෙවණ යටතේ ඔහු ඔහුට හෙවණ සළසා දෙනු ඇත.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “කවරෙකු දුප්පත් ණයකරුහට කල් දෙන්නේ ද, එසේ නැතහොත් ඔහු වෙනුවෙන් ඔහුගේ (ණයබර) සැහැල්ලු කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත් හෙවණක් නොමැති දිනයේ,
ඔහුගේ රාජ්යයේ හෙවණ යටතේ ඔහු ඔහුට හෙවණ සළසා දෙනු ඇත.” [صحيح] [رواه الترمذي وأحمد]

කවරෙකු ණයකරුට ණය ගෙවීමට කල් දෙන්නේ ද, එසේ නැතහොත් ඔහුගේ ණයබර සැහැල්ලු කරන්නේ ද එවැන්නෙකුට හිමි ප්රතිඵලය වනුයේ, ගැත්තන්ගේ හිසට හිරු ළඟා වන, එහි උෂ්ණත්වය ඔවුනට මහත් දරැණු වන, මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් තම රාජ්යය යටතේ ඔහුට හෙවණ ලබා දීමය. අල්ලාහ් කවරෙකුට හෙවණ ලබා දෙන්නේ ද ඔහු හැර වෙනත් කිසිවකු විසින් කිසිදු හෙවණක් නො ලබනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/4186